# ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය.

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මල්‍ය ක්‍රියාකාර්ත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. ගිණුම් විගණනය කිරීමෙන් පසුව 2012 මාර්තු 30 දින කෙටුම්පත් වාර්තාව නිකුත් කරන ලදී. කෙටුම්පත් වාර්තාවේ රු. 456,967ක ගිණුම්කරණ අඩුපාඩු පෙන්වා දුන් අතර රු.337,380 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදිකර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2012 අපෙල් 20 දින ඉදිරිපත් කරන ලදී. තෝරාගන්නා ලද නියැදියෙන් බාහිරව තවදුරටත් මෙවැනි අඩුපාඩු තිබීම විගණනයේදී බැහැර කළ නොහැක.

#### 1.2.2 නොසැසදු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල ස්ථාවර වත්කම් උපලේඛනයේ හා ස්ථාවර වත්කම් ලේඛනය අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| | ස්ථාවර වත්කම් උපලේඛනය | ස්ථාවර වත්කම් ලේඛනය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| Refrigeration Bath | 895,767 | 904,953 | 9,186 |
| Control Head | 13,061 | 169,042 | 155,981 |
| Biospec Nano | 1,530,738 | 1,512,894 | 17,844 |
| Microplate Reader | 3,232,877 | 3,494,606 | 261,729 |
| | | | 444,740 |

### 1.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි 1646 ප්‍රකාර දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ අදාල මාසයට පසු ඊළඟ එළඹෙන මාසයේ 15 වන දිනට පෙර විගණනයට ඉදිරිපත් කලයුතු වුවත් මාස 01 සිට මාස 10 ක ප්‍රමාදයකින් ඉදිරිපත් කර තිබුණු අතර, ඉදිරිපත් කරන ලද ධාවන සටහන්වල මයිලෝමීටරය පිළිබඳ සටහන්, ධාවනය කරන ලද දුර පිළිබඳ විස්තර හා ඉන්ධන දැවීම් පිළිබඳ සටහන් නොකිරීම් සහ වාහනය පාවිච්චි කල නිලධාරියා විසින් ඒ බව තහවුරු කරමින් අත්සන් කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

### 1.2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/98, 29/98(i), 07/2007(i) හා 02/2009 ට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනතාවය වෙනුවෙන් 2011 වර්ෂයේදී රු.13,816ක් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.35,130,967 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය රු.28,768,772 ක් විය. පුනරාවර්තන වියදම් සහ නඩත්තු වියදම් සඳහා රු.35,588,306 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.457,339ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.26,200,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌණතාවය රු.2,368,772ක් දක්වා අඩු වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වාසිදායක තත්ත්වයට සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රජයේ ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යයසාධනය

ආයතනයේ දර්ශනපති හා දර්ශන විශාරද වශයෙන් පශ්චාත් උපාධි පාඨමාලා 02ක් ද, විද්‍යාපති පාඨමාලා 02ක්ද වශයෙන් පශ්චාත් උපාධි පාඨමාලා 04ක් පවත්වා තිබුණු අතර ඒ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පසුගිය වසර 5 තුල නවක සිසුන් ඇතුලත් කරගැනීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | විද්‍යාපති (Msc) | දර්ශනපති (MPhil)/ දර්ශන විශාරද(PhD) |
|---|---|---|
| 2007 | 11 | 1 |
| 2008 | 13 | 5 |
| 2009 | 12 | 1 |
| 2010 | 19 | 1 |
| 2011 | 10 | - |

මීට අමතරව සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආයතනවල ලියාපදිංචි වී ඇති සිසුන් 07 දෙනෙකු පර්යේෂණ කටයුතු සිදුකරනු ලැබේ.

(ආ) සමාලෝචිත වර්ෂය තුල විද්‍යාපති උපාධිය සඳහා ශිෂ්‍යයන් 10 දෙනෙක් ලියාපදිංචි වී තිබූ අතර, දර්ශනපති / දර්ශන විශාරද උපාධි සඳහා එක් ශිෂ්‍යයෙක හෝ ඇතුලත් වී නොතිබුණි. වර්ෂය තුළ පශ්චාත් උපාධි ලබා පිටව ගිය සංඛ්‍යාව 09 කි.

(ඇ) 2011 වර්ෂය තුල නවක සිසුන් 10 දෙනෙක් ද, 2010 වසරේ විද්‍යාපති (Msc) උපාධිය සඳහා 19 දෙනෙක්ද, දර්ශනපති (MPhil)/ දර්ශන විශාරද(PhD) උපාධිය සඳහා 11 දෙනෙක් සහ අසමත් සිසුන් 04 දෙනෙක්ද, වක්‍ර සිසුන් 07 ක්ද වශයෙන් ආයතනයේ සිටි සම්පූර්ණ සිසුන් සංඛ්‍යාව 51ක් විය. එහෙත් රු.116,864,648 ක් වටිනා වර්ග අඩි 27000 ක සිව්මහල් ගොඩනැගිල්ලක ආයතනය පවත්වාගෙන යන අතර සමාලෝචිත වර්ෂය තුල රු.42,909,707 ක පුනරාවර්තන වියදමක් සහ රු.7,750,965ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණද ආයතනය සඳහා වෙන් කර ඇති සම්පත් සහ දරන ලද වියදම සලකා බැලීමේදී සම්පත් ඌණ උපයෝජනයක් පැවතුණි.

## 3.2 ගබඩා පාලනය

රසායනික ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රි පොතේ අයිතම 329 කින් අයිතම 24ක නියැදියක් සහ එන්සයිම (Enzymes) ඉනවෙන්ට්‍රි පොතේ අයිතම 63 කින් අයිතම 18ක නියැදියක් පරීක්ෂාකරන ලද අතර එහිදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රසායන ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රිවල රු.572,119 ක් වටිනා අයිතම් 15ක අචල (Non Moving) තොගයක් හා එන්සයිම ඉන්වෙන්ට්‍රිවල රු.944,431ක් වටිනා අයිතම් 18ක අචල (Non Moving) තොගයක් නිරීක්ෂණය විය.

(ආ) රසායන ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රිවල රු.465,985ක් වටිනා අයිතම් 10 ක සෙමින් චලනය වන (Slow Moving) තොගයක් නිරීක්ෂණය විය.

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

ආයතනයේ බැංකු ජංගම ගිණුමේ රු.12,085,507 ක බැංකු ශේෂයක් වර්ෂ අවසානයේ නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය තුල අවම මාසික ශේෂය රු.3,287,888 ක් වූ බැවින් එම අතිරික්ත මුදල් කෙටි කාලීනව ආයෝජනය කර ආදායම් උපයාගැනීමට අවධානය යොමුකර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කලයුතු වේ.

(අ) අත්තිකාරම්
(ආ) ගිණුම්කරණය
(ඇ) ඉන්වෙන්ට්‍රි භාණ්ඩ